Page 12 October 2009 .qxd 20/10/2009 07:57 Page 1



## ජාතියේ මුරදේවතාවෝ




# ශ්‍රීලංකා යුදහමුදවේ 60 වන සංවත්සරය උත්සවශ්‍රීයෙන් ආරම්භ වේ

**ශ්‍රී**ලංකා යුද හමුදාව ආරම්භ කර වසර 60 ක් පිරෙන ඔක්තෝබර් 10 වෙනි දින එනම් අද කොළඹ හමුදා මූලස්ථානයේ මේ නොබෝදා පත්වූ ලෙප්ටිනන්ට් ජෙනරාල් ජගත් ජයසූරිය අභිනව හමුදාපතිවරයා වෙනුවෙන් පැවැත්වූ ගෞරවාචාර පෙළපාලි දැක්මකින් ආරම්භ වීය. එසේම තව දින දෙකකින් (12) දැන් හමුදා මාණ්ඩලික ප්‍රධානියා වශයෙන් කටයුතු කරන, එසේම දැනට රාජකාරියේ නියුක්ත ව සිටින වඩාත් ජ්‍යෙෂ්ඨ තම නිලධාරියා වන, හිටපු හමුදාපති, මේජර් ජෙනරාල් සරත් පොන්සේකා මහතා වෙනුවෙන් ද හමුදා මූලස්ථානයේ ආචාර දැක්මක් පවත්වන්නට නියමිත ය.

ශ්‍රීලංකා යුද හමුදාව පොදුරාජ්‍ය මණ්ඩලීය හමුදාවක් ලෙස ප්‍රථමයෙන්ම පිහිටුවන ලද්දේ ශ්‍රීලංකාවට නිදහස ලැබී වසරකට පසු එනම් 1949 ඔක්තෝබර් 10 වෙනිදාය.

ගිය සතියේ, එනම් ඔක්තෝබර් 2 වෙනි දා, සංවත්සරයට මුල පුරමින් අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියස ආශිර්වාද පූජාවක් පැවැත්විණ හමුදාපතිවරයා ප්‍රමුඛ හමුදාවේ උසස් නිළධාරීන්ද භට පිරිසද එයට සහභාගි වූ අතර ත්‍රෛනිකායික සංඝයා වහන්සේලා එහිදී පිරිත් දේශනාකර සෙත් පැතූහ. සෙත් පැතීම් උත්සවය අවසානයේ හමුදාපතිවරයා විසින් යුදහමුදව වෙනුවෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අළුත් වැඩියා කටයුතු හා නඩත්තුව පිණිස රුපියල් මිලියනයක් අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම සිරි නිවාස ස්වාමීන්වහන්සේට බාර දෙන ලදී.

එසේම කොළඹ දී ක්‍රිස්තියානි, හින්දු හා මුස්ලිම් ආගමික පූජාවන්ද ශ්‍රීලංකා යුද හමුදාවට සෙත් පැතීම් වස් එකී දේවස්ථාන යන්හි පවත්වන ලද්දේ ය.

ශ්‍රීලංකා යුද හමුදාවට වසර 60 ක පිරීම සංකේතවත් කරන ප්‍රදර්ශනයක්ද කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ශාලාවේදී ශ්‍රීලංකා ජනාධිපතිවරයා විසින් විවෘත කරන ලදී. එය 3 වෙනිදා සිට 7 වෙනි දා දක්වා පැවැත්වුණු අතර, එහි දී හමුදාව කොටි ත්‍රස්තයින්ගෙන් අල්ලාගත් ආයුධ, උණ්ඩ, බෝම්බ සහ වෙනත් උපකරණද මහජන ප්‍රදර්ශනයට තිබූ අතර, ශ්‍රීලංකා හමුදාව සතුරා පරාජය කරන්නට යෙදූ යුද උපක්‍රම පිළිබඳවද එම ත්‍රස්ත සටනේ භයානකම අවසන් දින ගණන ගෙවුණු ආකාරය ගැනද හමුදා නිලධාරීන් විසින් ප්‍රදර්ශනය නැරඹූ ජනතාවට පැහැදිලි කරන ලද්දේය.

ශ්‍රීලංකා යුද හමුදාව ආරම්භ කර වසර හැටක් වන මේ දීර්ඝ කාලය තුළ හමුදාව මුහුණ දුන් ඉතා දරුණුම යුද මෙහෙයුම වනාහි දෙමළ කොටි ත්‍රස්තවාදය සහමුලින්ම විනාශ කිරීමයි. එම සටන් විජයග්‍රහණයෙන් යුතුව අවසන් කිරීම පිළිබඳව ශ්‍රීලංකා යුදහමුදාවට අතිශයින් ආඩම්බරවිය හැකිය. සිය දේශය රැකගන්නට ගුවන්, නාවික හා පොලිස් යන අනෙක් සහෝදර හමුදාවන් සමග උරෙන් උර ගැටී, බොහෝ විට ඒ හැමට වඩා පෙරමුණේම හිඳිමින් යුදහමුදාව කළ මෙහෙවර ද, දහස් ගණනින් කළ ජීවිත පරිත්‍යාගයන්ද කිසිදින අප රටට අමතක නොවේ. **Defenders of the nation** හෙවත් ජාතියේ මුරදේවතාවන් යන ව්‍යවහාරය ඔවුන්ට මනාව ගැළපේ. අද මුළු මහත් ලෝකයාම ඔවුන්ට හිස නමති.

♦ **වෙනුර**





Best Cheapest Air Fares to Colombo

වර්ල්ඩ් එයාර් ට්‍රැවල්ස්

KUWAIT AIR - £200 QATAR AIR - £300
SRI LANKAN AIR - £345 OMAN AIR - £160

All fares are subject to availability / Exclusive of taxes

OUR BEST VALUED SERVICES

✻ Car Hire and Hotel rates ✻ Seat / Meal Request
✻ Enroll for frequent Flyer Programme ✻ Travel Insurance
✻ Airline assistance for Elderly Passengers

CHRISTMAS SEASON LOWEST PRICES TO ASIA, EUROPE & WORLDWIDE

01737 215298 / 07865081261 (Dilhan Jayamanne)

World Air Travels Ltd
51 Ringwood Avenue, Redhill, Surrey RH1 2DY
e-mail : dilhan@worldairtravels.co.uk
Web : www.worldairtravels.co.uk


**ඕ පොසිටිව් හෝ නෙගටිව් ලේ වර්ගයේ (Blood Type O Positive or Negative) වකුගඩුවක් එංගලන්තයේ පදිංචි රෝගියෙකුට වහා අවශ්‍යව ඇත. දුරකතන 0208 416 3207 හෝ 07958622220 ට හෝ mabey@hotmail.co.uk විද්‍යුත් ලිපිනයට දැනුම්දෙන මෙන් කරුණාවෙන් ඉල්ලමි.**

## ♥ පැටියො ඩාලිං



" කියන්නකො චූටි පැටියො ඔයා මට ආදරේද කියලා........ "

" මොකද මේ කවදාවත් නැතුව තොදොල් වෙන්නෙ? මට පේන්නෙ මොකක් හරි ලොකු පිම්මක් පනින්න ලෑස්ති වෙනව වගේ .... "


Sam's CHICKEN CHICKEN CHICKEN

Great Tasting! Great Value!

සැම්ස් චිකන්

17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432


## Sinhala Lesson 02 සිංහළ පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !

**These Sinhala lessons are especially designed for the Sinhala expatriate children to learn Sinhala language correctly - also for foreigners who are keen to learn this beautiful language.**

------------ ----------- ---------- ---------- -------

**The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.**

### Vowel Strokes

ා ැ ෑ ි ී ු ූ ෘ
ෙ ේ ෛ ො ෝ

| | | |
|---|---|---|
| ක cup | කා car | කැ cat |
| කෑ cash | කි kit | කී key |
| කු cook | කූ cool | කෙ ken |
| කේ cane | කො cot | කෝ cone |
| | ක් tick | |

♦ ආචාර්‍යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 112

**හරහට :**
1 අරාබියේ දඬුවමක්
5 නිදහසක් නැති ගෙදර
6 මෙම වාහන දැන් අභාවයට යති
8 වැස්ස දාට මතක්වේ
9 නරපති 10 කදිම

**පහළට :**
2 සශ්‍රීක
3 ප්‍රමාද
4 නුවර ඉහළ පෙලැන්තිය
6 අන්ධකාරය
7 සාප්පුව

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | | 4 |
| ■ | 5 | | ■ | |
| 6 | | | 7 | |
| | ■ | 8 | | ■ |
| 9 | | ■ | 10 | |

**ගියවර නිවැරදි විසඳුම්**

**හරහට :** 1 ලිපිකරුවා 5 හිරු 6 අනන්තය 8 කාල 9 ලඳ 10 පඬු
**පහළට :** 2 පිහින 3 කරුන්කා 4 වාඩිය 6 අපල 7 තලප

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# වම්බටු අළු කෙසෙල් අර්තාපල් මිශ්‍ර ව්‍යංජනයක්

**අවශ්‍ය ද්‍රව්‍ය :**
අළු කෙසෙල් ග්‍රෑම් 100 යි
වම්බටු ග්‍රෑම් 100 යි
අර්තාපල් ග්‍රෑම් 100 යි
සූදුලූනු ග්‍රෑම් 100 යි
ලොකු බොම්බයි ලූනු ගෙඩියක්
අමුමිරිස් කරල් 3 යි
පොල් කිරි කෝප්ප 1 යි
කහ ලුණු රම්පෙ, කරපිංචා
සූදුරු කුඩු කොත්ත මල්ලි ස්වල්පයයි
උම්බලකඩ කුඩු හා උලුහාල් මේස හැඳි 1යි
බදින එළවළු තෙල් ප්‍රමාණයක්
ලියාගත් අමු ඉඟුරු කැබැල්ලයි

**සාදන ක්‍රමය:** අළු කෙසෙල්, වම්බටු, අර්තාපල් හා සුදු ලූනු සෝදා සුද්ද කර කුඩා හතරැස් කෑලිවලට කපා, කහ හා ලුණු තවරා, ගැඹුරු තෙලේ බැදගන්න. ඇතිලියකට තෙල් ස්වල්පයක් දමා ලිප තබා, රත්වුණු විට, ලියා ගත් ලූනු, රම්පෙ, කරපිංචා, උලුහාල්, ලියාගත් අමුමිරිස් හා අමු ඉඟුරු දමා රන්වන් පැහැ වනතෙක් බැද ගන්න. බැදුණු තෙලට කිරි කෝප්පය එක් කරන්න. එයට උම්බලකඩ කහ සූදුරු හා කොත්තමල්ලි කුඩු දමා හොඳින් කලවම් කරන්න. ඉන්පසු කලින් බැදගත් අල, වම්බටු, අළු කෙසෙල් හා සුදු ලූනු දමා කලවම් කරන්න. දිය ගතිය මදිනම් වතුර ටිකක් දමන්න. ලුණු ප්‍රමාණය බලා අවශ්‍යය නම් සීනි මේස හැන්දක් දමා රස හදා ගන්න.

♦ **මධුරි අබේවික්‍රම** Harrow UK